සැ. යු.-2015.10.02 දින පළ වූ අංක 1935 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,936 - 2015 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2015.10.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1714 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1715 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1711- B 80990—5,402 (2015/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාල මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 නොවැම්බර් මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 17 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | පන්නල | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ ඇලබඩගම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | බිංගිරිය | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ කරදපත්තුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | ගනේවත්ත | හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ තිත්තවැල්ගාල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

10-360

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

### ගම්පහ දිස්ත්‍රික්කය

අංක 1926 හා 2015.07.30 දිනැති *ගැසට්* පත්‍රයෙහි මවිසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2015.11.09 වැනිදා දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 23 වැනි දින.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | දොම්පෙ | දෙම්පෙ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

10-491

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම**

ගම්පහ දිස්ත්‍රික්කය

අංක 1926 හා 2015.07.30 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2015.11.09 වැනිදා දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 23 වැනි දින.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | වත්තල | වත්තල - මාබෝල ප්‍රදේශයේ දකුණු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

10-490

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2015

**2016/2018 අධ්‍යයන වර්ෂය සඳහා සත්ත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාවේ 2016/2018 අධ්‍යයන වර්ෂය සඳහා සීප්පුකුලම ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2015 දෙසැම්බර් මස මහනුවර දී පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව :*

2.1 මෙම පාඨමාලාව සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

2.2 මෙම පුහුණුව හුදෙක්ම වෘත්තිමය සුදුසුකම් ලබා දීමක් පමණක් වේ. (රජයේ රැකියාවක් ලබාගැනීම සඳහා මෙම වෘත්තීය සුදුසුකමට අමතරව, එම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබීම අත්‍යාවශ්‍ය වේ.)

2.3 පාඨමාලාව හදාරන කාලය තුළ දී සිසුන්ට දෛනිකව නේවාසික දීමනාවක් ලබාදෙන අතර, අමතරව අවශ්‍ය වන මුදල් සිසුන් විසින් සපයා ගත යුතු ය.

2.4 සෙනසුරාදා හා ඉරිදා යන දිනවල ද ඇතැම්විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාර වලින් බැහැරව යවන්නේ මසකට එක් සති අන්තයක දී පමණි.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (*අ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට සම්මාන සාමාර්ථ ද, තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතු ය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත් වී තිබිය යුතු ය. මෙහි දී එක් වරක දී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් තුනක් එක්වර සමත් වී තිබීම. (මෙම සුදුසුකම ඇති සිසුන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.);

*හෝ*

(*ආ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට සම්මාන සාමාර්ථ ද, තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත් වී තිබිය යුතුය. මෙහි දී එක් වරක දී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදරා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යා යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වී තිබීම. මෙම සුදුසුකම් ඇති අයැදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ 3.1(අ) හි අයැදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි.

3.2 2015 නොවැම්බර් 09 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවු. 17ට නොඅඩු විය යුතු අතර, අවු. 25 ට වැඩි නොවිය යුතුය.

3.3 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයැදුම්කරුවන් අයැදුම්පත් එවීම නොකළ යුතු ය. රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දැවුරුදු සත්ත්ව පාලන පාඨමාලාවක් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයැදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

04. *අයැදුම්පත් :*

4.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයැදුම්කරුවන් විසින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අයැදුම්පත් පිළියෙල කරගත යුතු ය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයැදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 විභාග ගාස්තුව රු. 150 කි. අපේක්ෂකයා විසින් එම මුදල හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පේරාදෙණිය, මහජන බැංකුවේ ගිණුම් අංක 057100179027275 වෙත බැර කරන ලද රිසිට්පතේ මුල් පිටපත අයදුම්පත්‍රයත් සමඟ අමුණා එවිය යුතුය. රිසිට්පතේ දරය පමණක් ඇලවිය යුතුය. තවද රිසිට්පතේ ඡායා පිටපතක් ලඟ තබාගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වන බැංකු රිසිට්පත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයැදුම්කරුවන්ගේ අයැදුම්පත් දැනුම්දීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයැදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2015.11.09 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙනසේ, අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතු ය.

4.4 අයැදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2016/2018 සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම" යන්න සඳහන් කරන්න.

4.5 අයැදුම්පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය. ඉල්ලා ඇති සහතිකවල පිටපත් අමුණා නැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

05. *බඳවා ගැනීම :*

5.1 පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5.2 ලිඛිත පරීක්ෂණය සඳහා වූ විෂයය නිර්දේශය පහත පරිදි වේ. :-

(i) සත්ත්ව පාලනය - අ. පො. ස. (සාමාන්‍ය පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස් කරන බහුවර්ණ කෙටි ප්‍රශ්න අඩංගු වේ. - කාලය පැය 01 යි.

(ii) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි.

5.3 ලිඛිත පරීක්ෂණය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම/හෝ පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මගින් ගෙවනු නොලැබේ.

5.4 විභාගය පැවැත්වෙන අවස්ථාවේදී අයැදුම්කරුවන් විසින් තම අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත සනාථ කර සිටිය යුතු ය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

5.5 යම් අයැදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බව තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටුවනු ලැබීමට යටත්වනු ඇත. එලෙසම පුහුණු පාඨමාලාව ආරම්භ කර මසකට පසු ඉවත්ව යන සිසුන් පුහුණුව සඳහා රජය මඟින් ඒ වනවිට දරා ඇති සියළු වියදම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට බැඳී සිටින්නේය. වියදම් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවන්නේය.

06. සෑම අයැදුම්කරුවෙකුම තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

07. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය ඩී. ආර්. ටී. ජී. රත්නායක,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් *(වැ. බ.)*

2015 සැප්තැම්බර් මස 23 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

**ඉල්ලුම් පත්‍රය**

***සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව***
***ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය***
***සත්ත්ව පාලන දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (2016/2018)***

විභාගයට පෙනී සිටීමට කැමැති මාධ්‍යය : ☐

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමඟ නම :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. ලිපිනය :————.

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
දිස්ත්‍රික්කය :————.

06. උපන් දිනය : අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

07. 2015.11.09 වැනි දිනට වයස :

අවුරුදු :——. මාස :——. දින :——.

08. දුරකථන අංකය :————.

09. *ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09. | | | |
| 10. | | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) විභාගය :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.)

10. මුදල් ගෙවූ බැංකු රිසිට්පත් අංකය :————.
(බැංකු රිසිට්පත ගලවා ගත හැකිවන පරිදි අමුණන්න).

11. අවසන්වරට අධ්‍යාපනය ලැබූ පාසල්/ආයතනය :————.

12. පාසලෙන්/ආයතනයෙන් අස්වූ දිනය :————.

13. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :————.

14. ග්‍රාම සංවර්ධන/කෘෂිකාර්මික/සමාජසේවා/ක්‍රීඩා පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය.) :————.

15. අයැදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

1. ————.
2. ————.

ඉහත දැක්වෙන විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය වූ ද, නිවැරදි වූ තොරතුරු බව මගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරක් හෙළිදරව් වුවහොත්, මාගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බව ද, පුහුණුව ලබන කාලයේ දී මා වෙනුවෙන් රජයට යම් මුදලක් ද ගෙවීමට සිදුවී නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන : මෙම අයදුම්පත සමඟ අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන :

1. ————.
2. ————.

***අත්සන සහතික කිරීම***

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ........... මහතා/මහත්මිය/මෙනවිය මා ඉතා හොඳින් හඳුනමි. නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ඉහත අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිලමුද්‍රාව තබන්න.)

10-434

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ
III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2015

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 1. ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 10 |
| 2. උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| 3. පෙර මුද්‍රණ සැලසුම්කරු | 01 |
| 4. කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | 07 |
| 5. මුද්‍රණ නිමැයුම්කරු | 02 |
| 6. මුද්‍රණ කාර්මික | 02 |

01. විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

02. *වැටුප් ක්‍රමය* : - අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III, II හා I ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය :

රු. 14,425 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,665

රු. 15,875 න් ඔබ්බට යාම සඳහා II ශ්‍රේණියට උසස් වීමද

රු. 17,745 න් ඔබ්බට යාම සඳහා I ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය.

03. සේවා කොන්දේසි :

මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදළ පරිදි දායක විය යුතුය. මෙම තනතුරු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරු වේ. එසේ වුවද දෙපාර්තමේන්තුව යටතේ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කරනු ලැබිය හැකිය. මෙම සේවා ගණයේ III ශ්‍රේණියට පවත්නා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

04. සුදුසුකම් :

කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදළ වේ.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. ''ඒ අනුව 1997.11.06 දිනට හෝ ඊට පෙර හා 1980.11.06 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.''

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වීම.

(ii) කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරු තනතුර සඳහා පමණක් ඉහත I හි සුදුසුකමට අමතරව අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අවශ්‍ය වේ.

(ඉ) වෘත්තීය සුදුසුකම් :

(i) 3 පන්තියේ III ශ්‍රේණියේ මුද්‍රණ කාර්මික තනතුර සඳහා මුද්‍රණ කාර්මික හා /හෝ විදුලි කාර්මික ක්ෂේත්‍රයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 5 මට්ටමේ සහතිකය හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන ඉහත ක්ෂේත්‍රවලට අදළව හදාරා ලබාගත් වෙනත් සහතිකයක්.

(ii) 3 පන්තියේ III ශ්‍රේණියේ අනෙකුත් සියලුම තනතුරු සඳහා ඒ ඒ තනතුරුවලට අයත් ක්ෂේත්‍රයට අදළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 5 මට්ටමේ සහතිකය හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන ඉහත ක්ෂේත්‍රවලට අදළව හදාරා ලබාගත් සහතිකය.

(ඊ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම මෙන්ම සේවයේ අවශ්‍යතාව මත දිවා රාත්‍රී සේවය කිරීමේ හැකියාව ද අපේක්ෂා කෙරේ.

* සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ නියමිත සුදුසුකම් 2015.11.06 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. *විභාග පරිපාටිය* :

මෙය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් යුක්තය. මෙම විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ලකුණු දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| (i) අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| (ii) අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 |
| (iii) අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 35 |
| (iv) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

ඉහත වගුවෙහි දක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණය ඇතුළත, එම ලකුණු ප්‍රදනය කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, පවතින පුරප්පාඩුවට බඳවාගනු ලැබේ.

06. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* :

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

07. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු රු. 250.00 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ 2015.11.06 දින හෝ එදිනට පෙර හෝ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇළවිය යුතුය. (රිසිට් පතෙහි ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. අයදුම්පත්‍රය A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් -

(අ) අංක 1 සිට 2 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 3 සිට 8 තෙක් ඡේදයන් දෙවන පිටුවට ද,

(ඇ) අංක 09 සිට 11 තෙක් ඡේදයන් තෙවන පිටුවටද ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(ඈ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයෙහි සඳහන් තනතුරේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

* නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය *ගැසට් නිවේදනයේ* දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනයට* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ ''කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015'' යන්න සඳහන් කරන්න.

8.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015.11.06 වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
තැ. පෙ. 1503, කොළඹ.

09. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :*

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක, ෆැක්ස් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රවේශපත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට, එම ලිපිය ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකරමින්ම විමසා සිටීමද සුදුසුය. තවද ඔබගේ තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරනලද කුවිතාන්සිය සුදානම්ව තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,<br>
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,<br>
විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015
Structured Interview for Recruitment to Grade III Posts of Management Assistant Technological Segment 3 Service Category - 2015

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 ☐
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

| තනතුරු නාමය | මනාපය |
|---|---|
| 1. ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | |
| 2. උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | |
| 3. පෙර මුද්‍රණ සැලසුම්කරු | |
| 4. කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | |
| 5. මුද්‍රණ නිමැයුම්කරු | |
| 6. මුද්‍රණ කාර්මික | |

(1, 2, 3, 4, 5 සහ 6 යන සංඛ්‍යා භාවිතාකර ඔබගේ මනාපය ඉහත කොටුව තුළ ලකුණු කරන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ -0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්)

3.0 3.1 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.2 2015.11.06 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.3 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| පාඨමාලාව | හැදෑරූ වර්ෂය | තාක්ෂණික ආයතනය | NVQ මට්ටම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.1 ඔබ ඉදිරිපත් කරන සෑම සහතිකයක්ම කුමන NVQ මට්ටමකින් පිළිගනු ලබන්නේද යන්න පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලබාගත් ලිපියක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

6.0 අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :————.

7.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

8.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

.............................................
.............................................

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී.. ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 *ආයතන ප්‍රධානියාගේ සහතිකය :* (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————,
නම :————,
තනතුර :————,
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10-335

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.